

Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 24

**පාඩම :- සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා (2 වන සතිය)**
**කාලච්ඡේද ගණන :- 10**

මෙම රටාව තිත් රටාවක් ලෙස පහත දැක්වෙන ආකාරයට පේළි 6ක් දක්වා දීර්ඝ කරන්න.

| රටාව | සංඛ්‍යාව |
|---|---|
|  | 1 |
|  | 4 |
|  | 9 |

**සමචතුරස්‍ර රටාවක් ලබා දෙන සංඛ්‍යා සමචතුරස්‍ර සංඛ්‍යා නම් වේ.**

ඉහත රටා උපයෝගී කර ගෙන 100 දක්වා සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ල ලියන්න.

1, 4, 9, 16, 25,.................................................................................................................


- සමචතුරස්‍ර සංඛ්‍යා රටාවක ඔබ දකින ලක්ෂණය ලියන්න.
- එකතුව 13 සහ අන්තරය (වෙනස) 5 වන සමචතුරස්‍ර සංඛ්‍යා දෙක ලියන්න.

33 පිටුවේ 14.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.


සිදුරු විදිනයකින් ලබා ගත් වෘත්තාකාර හැඩ පහත ආකාරයට අලවන්න.



පේළි ගණන 1 සංඛ්‍යාව 1



පේළි ගණන 2 සංඛ්‍යාව 3



පේළි ගණන 3 සංඛ්‍යාව 6

තවදුරටත් වෘත්තාකාර හැඩ ඇලවීමෙන් පේළි 10 ක් තෙක් සම්පූර්ණ කරන්න.

**ත්‍රිකෝණ රටාවක් ලබා දෙන සංඛ්‍යා ත්‍රිකෝණ සංඛ්‍යා වේ.**

සනකාභ හැඩැති සබන් කැට 28ක් ත්‍රිකෝණ රටාවක් ලැබෙන පරිදි සකස් කර ඇත.

I. එම රටාව ඇද පෙන්වන්න.
II. එම රටාවේ පේළි ගණන කීයද?
III. පහළම පේළියේ ඇති සබන් කැට ගණන කීයද?

පෙලපොතේ **34, 35** පිටු නිවැරදිව අධ්‍යයනය කරන්න. 35 පිටුවේ 14.5 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

පහත දැක්වෙන සංඛ්‍යා රටාවල ඊළඟ පද දෙක ලියන්න.

I. 3, 5, 7, 9, ............, ..................
II. 1, 4, 9, 16, ............., ................
III. 2, 6, 18, 54, ..............., .................
IV. 1, 3, 6, 10, ............, ..............

**කිසියම් රීතියකට අනුව පිළියෙල කර ඇති සංඛ්‍යා රටාවක එක් එක් සංඛ්‍යාව එම රටාවේ පදයක් ලෙස හඳුන්වයි.**

පෙලපොතේ 36 පිටුවේ 14.6 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

37 පිටුවේ ඇති මිශ්‍ර අභ්‍යාසය අමතර අභ්‍යාසයක් ලෙස නිවැරදිව සම්පූර්ණ කරන්න.

ඔබට මතුවන ගැටළු ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කොට නිවැරදි කරගන්න.